෨෦෨෦. ෦෯. ෦෩.

දිනමිණ

පිටුව 1, 2

# රටේ ආර්ථිකය ශක්තිමත් කරමින් උද්ධමනය පහළට

## ශ්‍රී ලංකා මහ බැංකුව

**මහින්ද අලුත්ගෙදර**

ප්‍රසුබැමකට ලක්ව තිබෙන ශ්‍රී ලංකාවේ ආර්ථිකයට යම්කිසි ශක්තියක් එක්කරමින් උද්ධමනය පහළ ගොස් තිබෙන බව ශ්‍රී ලංකා මහ බැංකුව පෙන්වා දෙයි. **පිට 02**

## රටේ ආර්ථිකය ...

ඒ අනුව කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය මේ වසරේ ජූලි මාසයේ පැවති සියයට 4.2 හි සිට පසුගිය අගෝස්තු මාසයේ දී සියයට 4.1 දක්වා සුළු වශයෙන් පහළ ගොස් තිබෙන බව ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත්කර තිබෙන නවතම වාර්තාවක් මගින් පෙන්වාදෙයි.

පසුගිය 2019 වසරේ අගෝස්තු මාසයේ පැවති ඉහළ පදනම් අගය හේතුවෙන් ඇති වූ සංඛ්‍යානමය බලපෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබෙන බව සඳහන් කරන එම වාර්තාව ආහාර කාණ්ඩයෙහි ලක්ෂ්‍යමය උද්ධමනය පසුගිය ජූලි මාසයේ පැවති සියයට 10.9 හි සිට අගෝස්තු මාසයේ දී සියයට 12.3 දක්වා ඉහළ ගොස් තිබේ. එසේ වුවද, ආහාර නොවන කාණ්ඩයෙහි ලක්ෂ්‍යමය උද්ධමනය ජූලි මාසයේ පැවති සියයට 1.5 හි සිට අගෝස්තු මාසයේ දී සියයට 0.8 දක්වා පහළ ගිය බවද කියාසිටී.

වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි වෙනස, අගෝස්තු මාසයේ දී සියයට 4.8 ක් ලෙස නොවෙනස්ව පැවතිණි.

අගෝස්තු මාසයේ දී කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි මාසික වෙනස සියයට 0.0ක් ලෙස වාර්තා වී තිබෙන අතර ආහාර කාණ්ඩයේ මිල ගණන් සියයට 0.1 කින් ඉහළ යෑම, ආහාර නොවන කාණ්ඩයේ ඒ හා සමාන ප්‍රතිශතයකින් සිදු වූ මිල පහළයෑම මගින් තුලනය වීම මේ සඳහා හේතු වී තිබෙන බවද ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව මගින් පෙන්වාදෙයි.

ඒ අනුව, අගෝස්තු මාසයේ දී ආහාර කාණ්ඩයෙහි පොල්, එළවළු සහ කහ මිල ගණන්වල ඉහළ යෑමක් වාර්තා වී තිබෙන අතර නැවුම් මත්ස්‍ය සහ දෙහි මිල ගණන්වල සැලකිය යුතු පහළ යෑමක් එම මාසයේ දී වාර්තා විය. ආහාර නොවන කාණ්ඩයෙහි, සෞඛ්‍ය (වෛද්‍ය රසායනාගාර සඳහා ගෙවීම්) උපකාණ්ඩයෙහි අයිතමවල මිල ගණන්, අගෝස්තු මාසයේ දී පහළ ගොස් තිබේ.

ආර්ථිකයෙහි යටිදූරි උද්ධමනය නිරූපණය කරන මූලික උද්ධමනය, අගෝස්තු මාසයේ දී සියයට 3.2ක් ලෙස නොවෙනස්ව පැවතුණි. කෙසේ වුවද, වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය ජූලි මාසයේ දී පැවති සියයට 4.0 හි සිට අගෝස්තු මාසයේ දී සියයට 3.8 දක්වා තවදුරටත් පහළ ගොස් ඇත.